# සාරාංශය

ක්‍රමයෙන් වර්ධනය වන විරැකියා ප්‍රශ්නයට පිළියම් ලෙස පුද්ගලයා වැඩ ලෝකයට හුරු කිරීමේ වගකීම පාසල වෙත පැවරී ඇත. කන්නන්ගර යුගයේ සිටම ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා සේවා නියුක්තිය අතර ගැලපීමක් ඇති කිරීමට විවිධ ක්‍රියා මාර්ග ගෙන තිබුණ ද වර්තමානය දක්වාම ඉන් නිසි ඵල ලබා ගැනීමට ලංකාවේ අධ්‍යාපන පද්ධතිය අසමත් වී ඇත. මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේ ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා විෂයය දැනට පාසල් වල ක්‍රියාත්මක වන ආකාරය විමසා බැලීම, ක්‍රියාත්මක තලයේ ගැටලු හඳුනා ගැනීම, ශිෂ්‍යයා රැකියාකට හුරු කිරීම සඳහා මෙම විෂයේ කළයුතු නවීකරණ පිළිබඳ ගුරු හා සිසු අදහස් විමසා බැලීම, ශිෂ්‍යයා රැකියාවකට හුරු කරවීම සඳහා මෙම විෂයේ කළ යුතු නවීකරණ පිළිබඳ සේවා යෝජක අදහස් විමසා බැලීම හා ශිෂ්‍යයා රැකියාවකට හුරු කරවීම සඳහා මෙම විෂයේ කළයුතු නවීකරණ සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම වේ. මෙහිදී නියැදිය ලෙස ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ මහරගම අධ්‍යාපන කොට්ඨාසයේ තෝරාගත් 1 AB, 1C හා 2 වර්ගයේ පාසල් තුනක, නම වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් 100 දෙනෙක්, එම පාසල් වල විෂය ඉගැන්වීමේ යෙදෙන ගුරුවරු 20 දෙනෙක්, එම පාසල් තුනේ විදුහල්පතිවරු තිදෙනා හා තවත් තෝරාගත් පාසල් දෙකක විදුහල්පතිවරු දෙදෙනෙක් ඇතුළුව විදුහල්පතිවරු පස් දෙනෙක්, මහරගම අධ්‍යාපන කොට්ඨාසයේ විෂයභාර අධ්‍යක්ෂ, අදාළ ගුරු උපදේශකවරු දෙදෙනා, ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයට සම්බන්ධ නිලධාරීන් දෙදෙනෙක් හා තෝරාගත් සේවා යෝජකයන් පස් දෙනෙක් යොදා ගෙන ඇත. ප්‍රශ්නාවලී හා සම්මුඛ සාකච්ඡා හරහා දත්ත රැස් කිරීම සිදු කර ඇති අතර, දත්ත විශ්ලේෂණය ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ද සිදු කර ඇත. මෙම පර්යේෂණය තුළින් අනාවරණය වන කරුණු ලෙස පාසල් පද්ධතිය තුළ ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා විෂයය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ප්‍රායෝගික ගැටලු හා විෂය නවීකරණය සඳහා පාර්ශවකරුවන් විසින් සිදු කරනු ලැබ ඇති යෝජනා ඉදිරිපත් කර ඇත.